**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් රු. 7,253,930 ක් සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | අධි හෝ ඌන වෙන්කිරීම් සඳහා කාලීනව ගැලපීම් සිදුකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩාවේ පැවති පිරිවැය රු. 580,250 ක් වූ ජල මීටර් 211 ක් අවසන් තොග ශේෂය තුල ඇතුලත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ගැලපුම් සිදුකිරීමට කටයුතු කරන බව. | අවසන් තොග වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ගල්රෝල කුලී පදනම මත ලබාදීම තුලින් උත්පාදනය වූ රු. 60,182 ක් වූ කුලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කිරීම මඟහැරී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විගණන ගාස්තු වෙන්කිරීම් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. | වගකීම් නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,544,809 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,004,505 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 3,886,627 ක් වූ හිඟ වරිපනම් ඒකක 2551 ක් තුල රාජ්‍ය වරිපනම් ඒකක 58 ක් සහ පෞද්ගලික වරිපනම් ඒකක 2493 කට අදාල පිළිවෙලින් රු. 280,983 ක් සහ රු. 3,605,644 ක් හිඟව පැවතුණි. හිඟ මුදල් | හිඟ වරිපනම් ගෙවීම සඳහා සහන කාලයක් ලබාදී ඇති බවත්, එම කාලසීමාව 2022 ඔක්තෝබර් අවසන් වූ විගස මුදල් නොගෙවූ සියළු දෙනාට අදාල දේපල තහනම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයකර ගැනීම සඳහා මාසික වාරික වශයෙන් ගෙවීමට අවස්ථාව ලබාදීම, විශාල වශයෙන් ඇති ශේෂ සඳහා රතු නිවේදන යැවීම සිදුකර තිබුණද, ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | | |

(ආ) **කුලී**

----

| | | |
|---|---|---|
| මාදම්පේ මාළු වෙළඳපල කඩකාමර 24 ක් හා ගබඩා කාමර 05 ක් ගිවිසුම්ගත වීමකින් තොරව සහ ආරක්ෂිත තැන්පතුවක් ලබා නොගෙන 2021 අප්‍රේල් මස 21 දින සභා තීරණයකින් තොරව බදු දී තිබුණි. මෙම මාළු වෙළඳපල ඉදිරිපස ප්‍රධාන මාර්ගයේ ඇති අනවසර මාළු කඩ ඉවත් කර දෙන ලෙස මාළු වෙළඳපල බදුකරුවන් ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීම් කර තිබුණද, එම අනවසර වෙළඳසැල් ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. එකී හේතුව මත බදුකරුවන් විසින් ඉහත කඩකාමර 29 කට අදාල 2021 අප්‍රේල් සිට හිඟ බදු මුදල් රු. 1,241,200 ගෙවීම් පැහැර හැර තිබුණු අතර, එම හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව අපොහොසත් වී තිබුණි. | සභාපතිතුමා ගනු ලැබූ තීරණයක් මත ටෙන්ඩර් කිරීමකින් තොරව වාර්ෂික බදු පදනමින් ලබාදීම සිදුකළ බවත්, මහජන පැමිණිලි මත ගිවිසුම්ගතවීමකින් තොරව කඩිනමින් විවෘත කිරීමට සිදුවූ බවත්, ගොඩනැගිල්ලෙහි ගැටළු සඳහා විසඳුම් නොලැබීම මත හිඟ මුදල් වර්ධනය වෙමින් පවතින බව හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ගිවිසුම්ගත නොවූ කඩකාමර සඳහා කඩිනමින් ගිවිසුම්ගත වියයුතු අතර, පවතින ගැටළු නිරාකරණය කර හිඟ මුදල් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව මඟින් රක්වාන ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති 02 හි ජල සම්බන්ධතා | ජල යෝජනා ක්‍රමයට පිරිපහදු ඒකකයක් නොමැති වීමත් ජලනල පද්ධතිය | ජල ව්‍යාපෘති අළුත්වැඩියා සිදුකර මනු කියුම් සවිකිරීම |

| | | |
|---|---|---|
| සඳහා ජල මීටර් සවිකිරීම සඳහා 2016 දෙසැම්බර් 30 දින සභා අරමුදලින් රු. 742,500 ක් වැයකර ජල මීටර් 270 ක් මිලදී ගෙන තිබුණද, විගණිත දිනය වූ 2022 පෙබරවාරි 02 දින වනවිට ජල මීටර් 59 ක් පමණක් සවිකර තිබුණි. ඒ අනුව ජල සම්බන්ධතා සඳහා ජල මීටර් සවිකර එහි කටයුතු විධිමත් කිරීමේ සභාවේ දායකත්වය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව ජල මීටර් මිලදීගෙන වර්ෂ 06 ක් ගතවී තිබුණද, අදාල අරමුණ ඉටු වී නොතිබුණි. | නිරන්තරයෙන් කැඩීයාම නිසා එමඟින් ගල් බොරළු යාමෙන් ජල මීටර් නිරන්තරයෙන් ක්‍රියාවිරහිත වන බැවින් ජල මීටර් සවිකිරීම මේ වනවිට නවතා දමා ඇති බවත්, ඉදිරියේදී ප්‍රතිපාදන සපයා ජල ව්‍යාපෘති විධිමත් කර ජල මීටර් යථා පරිදි සවිකිරීමට කටයුතු කරන බව. | මඟින් එම කටයුතු විධිමත්ව පවත්වා ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**පාරිසරික ගැටලු**

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 2160 ක් පමණ බැහැර කිරීම සඳහා වාහන 05 ක් සඳහා රු. 1,474,870 ක පිරිවැයක් සහ කාර්යය මණ්ඩල සේවකයින් 15 දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු. 6,617,808 ක් දරා තිබුණි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පැවතියද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව බලවින්න කසළ බැහැර කරන භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | 2021 වසර තුල කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබා දුන්නද, ඇස්තමේන්තු කළ මුදලට වඩා භාණ්ඩ හා සේවාවල මිල ඉහල යෑමෙන් ඉදිකිරීම් සිදුකිරීම කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කළ බව. | විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සැලසුම් කර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |